**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2018**
**-------------------------------------------------**

## 1.1 මතය
**-------**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම
**------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 නොවැම්බර් 08 දිනැති අංක HE/UD/09/DF/VPA/201 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය ප්‍රකාර විදේශ ගමන් සඳහා දේශීය අරමුදල් භාවිතා කිරීමට අනුමැතිය ලබා දී නොතිබියදී කෙටි කාලීන විදේශීය පුහුණු වැඩසටහන් 02 ක් සඳහා දේශීය අරමුදල් රු.9,293,409 ක් වැයකර නිලධාරීන් 19 ක් විදේශීය පුහුණුව සඳහා යොමු කර තිබුණි. | නිවාඩු හා ප්‍රදාන කමිටුවේ අනුමැතිය ලබාගෙන අදාළ පාඨමාලා ගාස්තු හා අනියම් දීමනා ගෙවීම විශ්වවිද්‍යාලය අනුගමනය කරන ක්‍රමවේදය විය. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම පාඨමාලාව සඳහා දේශීය අරමුදල් භාවිතා කිරීමට නොහැකි බව දැනුම්දෙන විට පාඨමාලාවට සහභාගීවී තිබුණි. | විධිමත් අනුමැතියක් මත ගෙවීම් සිදුකළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.56,929,162 ක් වූ සේවක ණය ශේෂය තුළ නිලධාරින් 10 දෙනෙකුගෙන් වර්ෂ 02 සිට වර්ෂ 09 දක්වා කාලයක් අයනොවන ණය ශේෂවල එකතුව රු.1,015,893 ක් වූ අතර ඉන් එකතුව රු.535,039 ක් වූ ණය ශේෂ 6 ක් ආපසු අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 2014/2 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 ඡේදයේ (iii) වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයට පර්යේෂණ දීමනා ගෙවීමේදී පර්යේෂණය ආරම්භ කර මාස 06ක් තුළ අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුවට ඉදිරිපත් කළ යුතු අතර එහි ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්වන්නේ නම් පමණක් පර්යේෂණ දීමනා ගෙවීම් අනුමත කළ හැක. එයට පටහැනිව අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින්ට 2018 වර්ෂය තුළදී එකතුව රු.27,999,162 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | අන්තර් පර්යේෂණ වාර්තා ලබාදෙන ලෙස කාර්යමණ්ඩලය දැනුවත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) වන වගන්තිය | පර්යේෂණයේ ස්වභාවය හා විෂය පථය පදනම් කරගනිමින් පර්යේෂණයක කාලසීමාව උපරිම වසර 03ක් වියයුතු වුවද , සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ආචාර්යවරුන් එකම පර්යේෂණය ඉටු කිරිම සඳහා වසර 04 සිට වසර 07 දක්වා කාලයක් ගතකළ අවස්ථා 04 ක් පැවතුණි. | වැඩිපුර ගෙවා ඇති දීමනා අයකර ගැනීමට තීරණය කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2014 සැප්තැම්බර් 03 දිනැති අංක UVPA/AE/2014/01 දරන විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර චක්‍රලේඛය | අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය 2014 ඔක්තෝබර් 01 දින සිට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවද පැමිණීමේ ලේඛනයක පමණක් සටහන් කර තිබූ අතර එහිදීද බොහෝ අවස්ථාවලදී පැමිණීම හෝ පිටවීම යන දෙකෙන් එකක් පමණක් සටහන් කර තිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.34,126,036 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.38,211,346 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,085,310 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වර්ෂයේ ආදායම රු.77,091,142 කින් වැඩිවීම හා වියදම රු.73,005,834 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් නිවාඩු වාර්තාව අනුව අධ්‍යයන සහායක කාර්යමණ්ඩලයේ නිලධාරීන් 08 දෙනෙකු 2018 වර්ෂය තුළ ඔවුන්ට හිමි නිවාඩු දින 45 ඉක්මවා දින 11 සිට දින 67 දක්වා නිවාඩු ලබාගෙන තිබුණත් එම නිවාඩු සඳහා වැටුපෙන් අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් මුදල් අයකර ගැනීමට තීරණය කර ඇත. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය ප්‍රකාර වැටුප් රහිත නිවාඩු වැටුපෙන් අයකර ගත යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015/2016 අධ්‍යයන වර්ෂයේ සංගීත පීඨයේ දේශන ආවරණය කිරිම සඳහා ස්ථිර හා තාවකාලික අධ්‍යයන කාර්යමණ්ඩලය 53 ක්ද බාහිර අධ්‍යයන කාර්යමණ්ඩලය 102 ක් ද සේවයේ යොදවා තිබුණි. විෂය මාලාව අනුව ඉගැන්වීමට නියමිත සම්පූර්ණ දේශන හා ප්‍රායෝගික පැය ගණන 40,015 ක් වූ අතර ඉන් පැය 16,680 ක් ස්ථිර හා තාවකාලික අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහාද පැය 22,060 ක් බාහිර අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහාද වෙන්කර තිබුණද ඉතිරි පැය 1,275 ක් බෙදාවෙන්කර නොතිබුණි. | බෙදා වෙන් නොකළ පැය ප්‍රමාණය ප්‍රායෝගික අභ්‍යාස සහ ස්වයං අධ්‍යයනයන් සඳහා යොදාගෙන ඇත. | විෂයමාලාව අනුව ඉගැන්වීමට නියමිත සම්පූර්ණ දේශන හා ප්‍රායෝගික පැය ප්‍රමාණයම අධ්‍යයන කාර්යමණ්ඩලය අතරේ බෙදා වෙන් කළ යුතුය. |
| (ආ) 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා නර්තන හා නාට්‍ය කලා පීඨයේ දේශන පැවැත්වීම පිළිබඳ නියැදි පරීක්ෂාවේදී ස්ථිර කාර්යමණ්ඩලයේ 10 දෙනෙකු සඳහා Work Norms මගින් වෙන් කළ යුතු පැය ගණනේ එකතුව 4,415 ක් වුවද පීඨය මගින් වෙන්කර තිබූ පැය ගණන 3,254 ක් විය. ඒ අනුව කථිකාචාර්යවරුන්ට දේශන පැය 1,161 ක් අඩුවෙන් වෙන්කර තිබූ අතරම වෙන්කර තිබුණ පැය ගණනින් පැය 571 ක් ආවරණය කර නොතිබුණු කථිකාචාර්යවරුන් 7 දෙනෙකු විය. | ඉදිරියේදී ආචාර්යවරුන්ට නියමිත පැය ගණන ආවරණය කිරීමට උපදෙස් දී ඇත. | සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා ආචාර්යවරුන් තමන්ට නියමිත දේශන පැය ගණන ආවරණය කළ යුතුය. |
| (ඇ) විශ්වවිද්‍යාලය විසින් දේශන ආවරණය කිරීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් සේවයේ යොදවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු.38,223,324 ක වියදමක් දරා තිබුණි. සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී සංගීත පීඨයේ දේශන පැය 810 ක් ආවරණය කිරීමට පත්කළ බාහිර අධ්‍යයන කාර්යමණ්ඩලයේ 08 දෙනෙකු විසින් එකම දේශනයක්වත් පවත්වා නොතිබුණු අතර 25 දෙනෙකු වෙන්කළ පැය ගණනින් සියයට 50 කට අඩු පැය ප්‍රමාණයක් ආවරණය කර තිබුණි. | ඉදිරියේදී බාහිර කථිකාචාර්යවරුන් ගේ ගෙවීම් අඩුකර ගත හැකිය. | බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් ගෙවීම් කිරීමට පෙර ඔවුන්ට නියමිත දේශන පැය ආවරණය කල බවට තහවුරු ලබා ගත යුතුය. |
| (ඈ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයට භාරදුන් පශ්චාත් උපාධි නිබන්ධන 24 කින් 12 ක ප්‍රතිඵල නිකුත් කිරීමට වර්ෂ 1ත් වර්ෂ 2 ත් අතර කාලයක් ගත කර තිබුණ අතර පරීක්ෂකවරුන් පත්කිරීම ප්‍රමාදවීම, පරීක්ෂකවරුන් නිබන්ධන පරීක්ෂා කිරීමට වැඩි කාලයක් ගතකිරීම වැනි කරුණු මීට හේතුවී තිබුණි. | විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් මේ වනවිට සකස්කර ඇත. | විභාග ප්‍රතිඵල කඩිනමින් නිකුත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) උපරිම කාලය අවුරුදු 4 ක් වන දර්ශන විශාරද පාඨමාලාව සඳහා 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලියාපදිංචි වූ විද්‍යාර්ථීන් 65 දෙනෙකුගෙන් 21 දෙනෙකු හෙවත් සියයට 32 ක් පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණු අතර 41 ක් හෙවත් සියයට 63 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. 3 දෙනෙකුගේ නිබන්ධන විභාග අංශයට භාරදී තිබුණි. | විද්‍යාර්ථීන් 18 ක් පමණක් පශ්චාත් උපාධි සම්පූර්ණ කර ඇත. | සිසුන් පාඨමාලා හැරයාම අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) නර්තනය පිළිබඳ එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2008, 2009 සහ 2011 වර්ෂ තුන සඳහා සිසුන් 239 දෙනෙකු ලියාපදිංචි වී තිබුණද ඉන් 60 ක් හෙවත් සියයට 25 ක් පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. විද්‍යාර්ථීන් 64 දෙනෙකුගේ නිබන්ධන පරික්ෂා කරමින් පැවති අතර 115 දෙනෙකු හෙවත් සියයට 48 ක් නියමිත දිනට නිබන්ධන භාර නොදීම නිසා පාඨමාලාව හැර ගියාසේ සලකා තිබුණි. | එක් අවුරුදු විභාගය සම්පූර්ණ කළ අයට ඩිප්ලෝමා සහතිකයක් පිරිනමා ඇති අතර ඉතිරි අය පාඨමාලාව හැර ගියාසේ සලකා ඇත. | විභාග ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට හා සිසුන් පාඨමාලා හැරයාම අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) 2016 අගෝස්තු මාසයේ උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට සුදුසුකම් ලැබූ සිසුන් වසර 1 ½ ක කාල ප්‍රමාදයකින් පසු 2018 ජූනි මාසයේදී 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත් කරගෙන තිබුණි. 2017 අගෝස්තු මාසයේ උසස් පෙළ සමත් වී 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට සුදුසුකම් ලැබූ සිසුන් මාස 17 ක් ගත වී ඇතත් 2019 මැයි 15 දින වනවිටත් විශ්වවිද්‍යාලයට ඇතුළත් කරගෙන නොතිබුණි. | කාර්යමණ්ඩල වැඩවර්ජනය නිසා බඳවා ගැනීමට ප්‍රමාද විය. | උසස් පෙළ ප්‍රතිඵල නිකුත්වීමෙන් පසු සුදුසුකම් ලැබූ සිසුන් බඳවා ගැනීම කඩිනම් කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රාසාංගික කලා උළෙලක් සඳහා රු.1,792,500 ක් වැයකිරීමට මුදල් කමිටුව විසින් අනුමැතිය ලබාදී තිබූ අතර මෙහි ආලෝකකරණ හා ශබ්ද පරිපාලන කටයුතු සඳහා ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව සැපයුම්කරුවෙකු තෝරාගෙන ඒ වෙනුවෙන් රු.900,000 ක් ගෙවා තිබුණි. | ශිෂ්‍ය සංගමය විසින් මිල ගණන් ලබාගෙන ඇති අතර, ඒවා කලා උළෙල ආරම්භ වී දිනකට පසු විශ්වවිද්‍යාලයට ලබාදී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ උපාධිධාරින්ගේ ගුණාත්මකභාවය, රැකියා නියුක්තිභාවය සහ ව්‍යාවසායකත්ව කුසලතා වර්ධනය කිරීමේ කාර්යය හා පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා අත්කර ගැනීම සම්බන්ධයෙන් වූ කාර්යයන් වර්ෂය අවසාන වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි. | ඉලක්ක සපුරා ගැනීමේදී විවිධ අභියෝගවලට මුහුණදීමට සිදු විය. | උපායමාර්ග සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) උපායමාර්ග සැලැස්මේ ඉලක්ක යටතේ දක්වා තිබූ විශ්වවිද්‍යාලයේ දුරස්ථ අධ්‍යයන යාන්ත්‍රණය උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා වූ නව බාහිර උපාධි පාඨමාලා හඳුන්වාදීම, දෙමළ, හින්දි, ජපන් සහ කොරියන් භාෂා සඳහා සහතිකපත්‍ර පාඨමාලා හඳුන්වාදීම සහ ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව උසස්පෙළ ගුරුවරුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා හඳුන්වා දීම යනාදී කාර්යයන් ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර සිසුන්ගේ විරෝධතා නිසා බඳවා ගැනීමට නොහැකි වීමත් නව භාෂා පාඨමාලා ආරම්භ කරනවාද නැද්ද යන්න ඉදිරියේදී තීරණය කිරීම හා මෙයට විකල්පයක් ලෙස පශ්චාත් උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | උපායමාර්ග සැලැස්ම තාත්වික විය යුතු අතර එහි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් අයිතම 05 ක එකතුව රු.37,000,000 ක් සහ පුනරාවර්තන වියදම් අයිතම 05 ක එකතුව රු.1,505,000 ක් උපයෝජනය කර නොතිබුණි. එසේම වියදම් අයිතම 11 ක අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර විචලනය සියයට 50 ඉක්මවා තිබීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. | නොවැලැක්විය හැකි හේතුමත ඇස්තමේන්තු වියදම් හා සත්‍ය වියදම් අතර වෙනස්කම් ඇති විය. | අයවැය විචලතාවයන් හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**4.3** තිරසර සංවර්ධන අරමුණු

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වේ. එහෙත් සමාලෝචිත වර්ෂයට අදාළව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ඉලක්ක හඳුනාගෙන තිබුණද, එම ඉලක්ක කරා ළඟාවීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන අරමුණු හා ඉලක්ක ආයතනයේ සැලසුම් වලට ඇතුළත් කිරීම, දර්ශක සකස් කිරීම, දත්ත පවත්වා ගැනීම හා සංධිස්ථානයන් හඳුනා ගැනීම සිදුකර නොතිබුණි. | 2019/2021 උපායමාර්ග සැලැස්ම සඳහා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම ඇතුළත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ විෂයපථය යටතට ගැනෙන ඉලක්ක කරා ළඟාවීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන අරමුණු හා ඉලක්ක ආයතනයේ සැලසුම්වලට ඇතුළත් කිරීම ,දර්ශක සකස්කිරීම ,දත්ත පවත්වා ගැනීම හා සංධිස්ථානයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |